කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT




# බීසීසී ලංකා ලිමිටඩ්

## කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2025

# බීසීසී ලංකා ලිමිටඩ්

## 01. හැඳින්වීම

සීමාසහිත බීසීසී ලංකා ලිමිටඩ් 1988 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය සතු කොටස් 10,000,000 ක කොටස් ප්‍රාග්ධනයක් සහිත සීමිත වගකීම් සහිත පොදු සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද අතර එය 1987 අංක 23 දරන පොදු පනත යටතේ රාජ්‍ය සංස්ථාවක් සහ රජය සතු ව්‍යවසායක් බවට පරිවර්තනය කරන ලදී.

බීසීසී ලංකා යනු රජය මගින් පාලනය වන පාරිභෝගික නිෂ්පාදන සැපයුම්කරුවෙකි. සමාගමේ ප්‍රධාන ව්‍යාපාරය වන්නේ දේශීයව නිෂ්පාදනය කරන ලද ආහාරයට ගත හැකි පොල්තෙල් සහ සබන්, සේදුම්කාරක, විෂබීජ නාශක සහ අනෙකුත් සබන් පදනම් කරගත් නිෂ්පාදන නිෂ්පාදනය, විකිණීම සහ බෙදා හැරීමයි.

**සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්**

- පොල්තෙල් පිරිපහදු කිරීම.
- ඇඟ ගල්වන සබන් සහ , පිරිසිදු කිරීමේ සබන් නිෂ්පාදනය
- විෂබීජ නාශක සහ සේදුම්කාරක නිෂ්පාදනය
- සමාගම විසින් පත් කරන ලද නියෝජිතයින් හරහා " බීසීසී " නමින් නිෂ්පාදන දේශීය වෙළඳපොළට බෙදා හැරීම
- ගිවිසුම් සහ තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටි මගින් නවීන වෙළඳ ව්‍යාපාර වෙත සෘජු විකුණුම්
- බීසීසී ලංකා ලිමිටඩ් සතු කාර්යාල සහ ගබඩා ඉඩකඩ කුලියට දීම.

සීමාසහිත බී සී සී ලංකා ලිමිටඩ් හි ප්‍රධාන නිෂ්පාදනයන් සබන් කර්මාන්ත ශාලාවක්, පොල්තෙල් පිරිපහදුවකින් සමන්විත වේ. මෙම යන්ත්‍ර සූත්‍ර මගින් නිපදවන නිෂ්පාදන පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

### 1. සබන් කර්මාන්ත ශාලාව

සබන් කර්මාන්ත ශාලාව රෙදි සෝදන සබන්, ඇඟ ගල්වන සබන්, සහ විෂබීජ නාශක සහ සේදුම්කාරක නිෂ්පාදනය කරයි. ඔවුන්ගේ වෙළඳ නාම සහිත නිෂ්පාදන පහත දැක්වේ.

1) ඇඟ ගල්වන සබන් – සඳුන් සබන්, සුවේන්ද්‍ර ෆ්ලෝරල්, සුවේන්ද්‍ර හර්බල්, හෙල්ත් ජෝයි
2) රෙදි සෝදන සබන් – සවරින් බාර්, ස්නෝ වයිට්
3) විෂබීජ නාශක – පයිනෝල්, වැසිකිලි බඳුන් පිරිසිදුකාරක
4) පවිත්‍රකාරක – පිඟන් සෝදන දියර, පිඟන් සෝදන කුඩු ,ස්නෝ වයිට් සේදුම්කාරක දියර
5) එයාර් ෆ්‍රෙෂ්නර්

### 2. පිරිපහදු නිෂ්පාදන


සුදු පොල්තෙල් සහ කුක්ස් ජෝයි යන වෙළඳ නාම යටතේ පිරිපහදුව පොල් තෙල් නිෂ්පාදනය කරයි. මෙම නිෂ්පාදන පහත බහාලුම්වල අලෙවි කෙරේ.

කුක්ස් ජෝයි - 500ml, 01ltr, 05ltr, 20ltr

සුදු පොල්තෙල් - 500ml,01ltr, 05ltr, 20ltr

**01. නිෂ්පාදන ප්‍රමාණය (2021-2024)**


| විස්තරය (මෙ.ටොන්) | 2020-2021 | 2021-2022 | 2022-2023 | 2023-2024 |
|---|---|---|---|---|
| සබන් | 136.06 | 178.86 | 142.57 | 253.89 |
| පිරිපහදු කරන ලද පොල්තෙල් | 288.37 | 828.68 | 775.59 | 701.35 |




ප්‍රස්ථාර 01 අනුව බීසීසී ලංකා ලිමිටඩ් හි 2021 සිට 2024 දක්වා සබන් හා පොල්තෙල් නිෂ්පාදනය වර්ධනය වී ඇත.

**02. විකුණුම් හා විකුණුම් පිරිවැය (2021-2024)**

| විස්තරය (රු.මිලි) | 2020-2021 | 2021-2022 | 2022-2023 | 2023-2024 |
|---|---|---|---|---|
| විකුණුම් ආදායම | 305.52 | 825.15 | 907.79 | 920.35 |
| විකුණුම් පිරිවැය | 199.89 | 620.52 | 683.65 | 660.64 |
| දල ලාභය | 105.63 | 204.62 | 223.81 | 259.70 |





ප්‍රස්ථාර 02 අනුව බීසීසී ලංකා ලිමිටඩ්හි විකුණුම් ආදායම 2021 වසරේ සිට 2024 දක්වා අඛණ්ඩව ඉහළ ගොස් ඇත. ප්‍රස්ථාරයට අනුව 2021 වසරේ සිට 2024 දක්වා දළ ලාභයෙහි වර්ධනයක් පෙන්වයි.

## 03. පුනරාවර්තන වියදම් (2021-2024)


| විස්තරය (රු.මිලි) | 2020-2021 | 2021-2022 | 2022-2023 | 2023-2024 |
|---|---|---|---|---|
| පරිපාලනය | **57.45** | **72.06** | **94.39** | **118.86** |

ප්‍රස්ථාර 03 අනුව බීසීසී ලංකා ලිමිටඩ්හි පුනරාවර්තන වියදම් 2021 වසරේ සිට 2024 දක්වා අඛණ්ඩව ඉහළ ගොස් ඇති අතර ණය මුදල ගෙවා දැමීම නිසා මූල්‍ය වියදම් අඩු වී ඇත.



**04.** බදු පෙර ශුද්ධ ලාභය හා බදු පසු ශුද්ධ ලාභය ( 2021-2024)


| විස්තරය (රු.මිලි) | 2020-2021 | 2021-2022 | 2022-2023 | 2023-2024 |
|---|---|---|---|---|
| බදු පෙර ශුද්ධ ලාභය | 43.6 | 124.75 | 149.17 | 155.73 |
| බදු පසු ශුද්ධ ලාභය | 41.16 | 122.96 | 117.93 | 102.46 |




ප්‍රස්ථාර 04 අනුව බීසීසී ලංකා ලිමිටඩ්හි 2021 සිට 2024 දක්වා බදු පෙර ලාභය දිගින් දිගටම වර්ධනය වී ඇත.


**05.** ස්ථාවර වත්කම්/ ජංගම වත්කම් / ජංගම වගකීම් (2021-2024)

| විස්තරය (රු.මිලි) | 2020-2021 | 2021-2022 | 2022-2023 | 2023-2024 |
|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් | 8206.51 | 8227.67 | 4375.02 | 4372.28 |
| ජංගම වත්කම් | 319.83 | 445.94 | 7808.37 | 569.05 |
| ජංගම වගකීම් | 104.75 | 92.99 | 121.83 | 132.53 |




## 06. ස්ථාවර තැන්පතු/ භාණ්ඩාගාර බිල්පත් (2021-2024)

| විස්තරය (රු.මිලි) | 2020-2021 | 2021-2022 | 2022-2023 | 2023-2024 |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු/ භාණ්ඩාගාර බිල්පත් | **175.98** | **187.75** | **223.58** | **85.36** |



**නිරීක්ෂණ සහ නිර්දේශ**

- පොල්තෙල් වල පෝෂ්‍ය පදාර්ථවල සංයුතිය සහ රසායනික අන්තර්ගතය පිළිබඳ දැවැන්ත සැලකිල්ලත් සමඟ, පසුගිය වසරවල බී.සී.සී. සමාගම ආහාරයට ගත හැකි තෙල් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.

- බී.සී.සී. සමාගමට, සබන් නිෂ්පාදන වෙළඳපල කොටස අත්පත්කර ගැනීම  වෙළඳපලතුල කීර්තිනාමය නංවාලීම සඳහා ප්‍රයෝජනවත් වේ.

- බී.සී.සී.සන්නාම නාමයේ විශ්වාසනීයත්වයේ වාසිය ලබා ගැනීමෙන්, සමාගමට ඉහළ ලාභයක් ලබා ගැනීමේ විශාල අවස්ථාවක් ඇති බැවින් ලාභදායිත්වය ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

- බී.සී.සී.ලංකා ලිමිටඩ් සමාගමේ සුභදතාවයේ දියුණුවත් සමඟ, සමාගම අනාගතයේ දී වඩා හොඳ ලාභයක් සහ ස්ථාවරත්වයක් ලබා ගැනීමට හේතු වන අගය එකතු කළ නිෂ්පාදන සමඟ නව වෙළඳපල ගවේෂණය කිරීමට උත්සාහ කර ඇත.